සමස්ත වැඩකරන ජනතාව ඇතුළු
පොදු ජනතාව වෙත කෙරෙන ආයාචනයයි....

# උතුරු පළාත් සභා ඡන්දය පැවැත්විය යුතුය. පළාත් සභා සහිත ඒකීය රාජ්‍යය රැක ගනිමු.

උතුරු පළාත් සභා මැතිවරණය ප්‍රකාශයට පත් කිරීමත් සමඟම පළාත් සභා අහෝසි කළ යුතුයයි දකුණෙන් යලිත් හඬක් මතුකර තිබේ. මෙය දේශපාලන කුමන්ත්‍රණයකි. මෙහි පිටුපස ක්‍රියාත්මක වන්නේ ජාතිවාදීන්, මූලධර්මවාදීන්, සහ මිලිටරිවාදීන්ය. මෙය පළාත් සභා හරහා සියළු ජනතාවන්ට ලබාදුන් ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය උදුරා ගැනීමකි. මීට ආසන්නම හේතුව වශයෙන් දක්වන්නේ උතුරු පළාතේ දමිල ජාතික සන්ධානය බලයට පත්විය හැකි බවයි. එසේ නම් අපි උතුරු පළාතට ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය අහිමි කරමුද? ඊළඟට ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය අහිමි වන්නේ දකුණේ අපටය. උතුරු පළාතේ බලයට පත්වන්නේ දෙමළ ජාතික සන්ධානය නම් අපි එම යථාර්තය පිළිගෙන එම ජනතාව එක්සත් ජනතා නිදහස් සන්ධානයට දිනා ගැනීම සඳහා සම්පව කටයුතු කළ යුතුය.

පළාත් සභා මේවන විට පුරා වසර 25ක් ක්‍රියාත්මක වී තිබේ. එහෙත් එය උතුරේ මෙන්ම නැගෙනහිර පළාත්වල ද ක්‍රියාත්මක වූයේ නැත. නැගෙනහිර පළාත් සභාව පිහිටුවනු ලැබුවේ තොබෝදාය. වසර 25කට පසු මේ පළාත් සභා ප්‍රශ්නය මතු කරනු ලබන්නේ පැහැදිලිවම උතුරේ ජනතාවට හිමි එකී ප්‍රජාතන්ත්‍රවාදය අහිමි කිරීමේ දුෂ්ඨ අරමුණ ඇතිවය. එවැනි අරමුණක් ඇතිවීමට හේතුව දෙමළ ජන ප්‍රදේශවල යටත් පාලනයක් පවත්වා ගැනීමය. අනික එම ප්‍රදේශ වලට ඔවුන්ට ඇතුලු වීමට නොහැකි වීමය.

13 වන ව්‍යවස්ථා සංශෝධනය හරහා පළාත් සභා ක්‍රමය ස්ථාපිත කරනු ලැබුවේ ''බලතල බෙදීමේ'' සංකල්පය මතය. එය ප්‍රජාතන්ත්‍රවාදය පුළුල් කිරීමේ, ගැඹුරු කිරීමේ හා ප්‍රගුණ කිරීමේ ක්‍රමවේදයකි. එමගින් සෑම පලාතකම සිටින බහුතර ජනතාවට පළාතේ අභ්‍යන්තර කටයුතු පාලනය කිරීමට හිමිකමක් ලබා දෙමින් සිංහල ජනතාවට මෙන්ම දමිල හා මුස්ලිම් ජනතාවට ද එම ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය තහවුරු කරදීමකි. මුළු දිවයිනටත් සියළු ජනතාවටත් එම ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය පළාත් සභා හරහා පිරිනමනු ලැබුවේ ඒ අනුවය.

සෙසු පළාත්වල ජනතාව පුරා වසර 25ක් භුක්ති විඳි අයිතිය උතුරේ ජනතාවට අහිමි කළ එල්.ටී.ටී.ඊ. යුධ බලය පරාජය කිරීමෙන් පසු නැවතත් ඔවුන්ට එම බලය ලබාදීම සඳහා පළාත් සභා මැතිවරණය පැවැත්වීමට රජය සූදානම් වන විට පළාත් සභා ක්‍රමයම අහෝසි කළ යුතුයැයි ඉල්ලා සිටින්නේ සමස්ථ ලාංකේය පළාත් සභාවලට හිමිවන බලය යටත් කර තැබීමේ අපේක්ෂාවෙන්ය. පළාත් බලය පලාතටත්, රටේ බලය සමස්ථ ලාංකේය ජනතාවටත් ලබා දෙන ප්‍රජාතන්ත්‍රවාදය සියළු ජනවර්ගයන්ගේ අපේක්ෂාවන් සඳහා ද විසඳුමකි.

දකුණේ මෙම උද්ඝෝෂණයට ප්‍රතික්‍රියාවක් හැටියට යළි උතුරේ බෙදුම්වාදීන් පන ගැන්වෙනු ඇත. සිංහල ජාතිවාදය සහ උතුරේ බෙදුම්වාදය අන්නොන්‍ය වශයෙන් පෝෂණය කරනු ලබන ප්‍රපංචයකි. සිංහල ජාතිවාදීන් ඉල්ලා සිටින්නේ රටේ බලයත් පළාත් බලයත් දෙකම සිංහල බහුතරයට යටත් කරන ලෙසය. මෙය ජාතික සමගිය ඇති කිරීම වලක්වන්නකි. ජාතික සමගිය ඇතිනොවන තාක් කල් රටේ සමාජ ආර්ථික ප්‍රශ්න යටපත් වන්නේය. ගොවියන්, කම්කරුවන් ධීවරයන් ආදී වූ වැඩකරන ජනතාව එක්සත්වීම වලක්වන්නේය.

දහස් ගණන් ජීවිත පරිත්‍යාග කරමින් සහ දේපල විනාශයට ලක් කරමින් හා මහා ධනස්කන්ධයක් වැය කරමින් හමාර කළ තිස් වසරක යුද්ධයට පසු දකුණේ ජනතාව භුක්ති විඳින ප්‍රජා අයිතිය උතුරේ ජනතාවට ද ලබා දීමට සූදානම් වන විට ජාතිවාදීන්, මූලධර්මවාදීන් සහ

මිලිටරිවාදීන් පළාත් සභා අහෝසි කළ යුතුයැයි ඉල්ලා සිටින්නේ දෙමළ ජනතාව එල්.ටී.ටී.ඊ. මතවාදය වෙත නැවත තල්ලු කර දැමීමටද? බෙදුම්වාදීන්ට නැවත සරු බිමක් තනාදීමට ද? ජාතිවාදය යළි අවුස්සා බෙදුම්වාදය යළි පණ ගන්වා වැඩකරන ජනතාවගේ බලවේගයන් අවුල් කර දමා අධිරාජ්‍යවාදීන්ගේ අතපෙවීම සඳහා මඟ පෑදීමකටද?

පළාත් සභා ක්‍රමය අහෝසි නොකරන බවට රජය දුන් ප්‍රතිඥාවන් කඩකිරීමට හෝ උතුරේ පළාත් සභා මැතිවරණය පැවැත්වීමට පෙර පළාත් සභාවල බලතල අඩු කිරීමට කරන බලපෑම ජාතික සමඟිය ඇති නොකරන මාවතය.

ජාතික සමඟිය ඇති කිරීම උදෙසා අවසන් විසඳුමක් ලබාදීම පිණිස පාර්ලිමේන්තු කාරක සභාවක් පත් කිරීමට රජය තීරණය කර තිබියදී සියළු ව්‍යවස්ථා සංශෝධන යෝජනා එම කමිටුවට යොමු කළ යුතුයයි රජය තීරණය කර තිබියදී උතුරේ ඡන්දයට පෙර වහාම ඒ බලතල කප්පාදු කළ යුතුයැයි හඬ නගන්නේ ජාතික සමඟියේ මිනීවළ කැපීමටය. උතුරේ දෙමළ ජනතාව යටත් කළ පාලනයක් තුළ රඳවා තබා ගැනීමේ මර්දනකාරී අරමුණ ඇතිවය.

පොලිස් බලතල හා ඉඩම් බලතල මේ වන තෙක් කිසිදු පළාත් සභාවක් විසින් ක්‍රියාවට නංවා නැත. ගතවූ වසර 25 තුළම සියළුම ජනාධිපතිවරුන්ගේ පාලන කාලය තුළ ඒවා ක්‍රියාත්මක කළේ මධ්‍යම ආණ්ඩුව විසිනි. එසේ නම් උතුරේ ඡන්දයට පෙර ඒවා ඉවත් කළ යුතුයැයි ඉල්ලා සිටින්නේ ඇයි?

පළාත් සභා විසුරුවා හැරීමේ බලයද ජනාධිපති සතුව තිබියදී ජනතාව තුළ හුඹස් බියක් ජනිත කරන්නේ ඇයි?

පළාත් සභා දෙකක් ඒකාබද්ධ කිරීමේ බලය ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අවලංගු කරනු ලැබ ඇත. දැනට ක්‍රියාවිරහිත කර ඇති එම ප්‍රතිපාදන පළාත් සභා පනතින් ඉවත් කිරීමට රජය දැනටමත් තීරණය කොට තිබේ. ඊට අදාල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිපාදනය ඉවත් කිරීමට රජය සූදානම්ය. නැතහොත් සෙසු ව්‍යවස්ථා සංශෝධනය සමගම පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවට එයද සලකා බැලිය හැකිය.

13 වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ හෝ පළාත් සභා පනතේ හෝ අවශ්‍ය සංශෝධන පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවට සලකා බැලිය හැකිය. එය සිදු කළ යුත්තේ අදාල සියලු පාර්ශවකරුවන් වූ දේශපාලන පක්ෂවල සහභාගිත්වය ඇතිවය. ආණ්ඩුව ඒකපාර්ශවිකව තීරණ ගතයුතු නොවේ.

ඊලාම් සන්නද්ධ බලය බිඳ දමා යුද්ධය අවසන් කළෙමු.
දැන් ශ්‍රී ලාංකේය ජාතිය නිර්මාණය කිරීමේ වගකීමට කැපවෙමු.

ඒ උදෙසා

- **උතුරු පළාතේ ඡන්දය පැවැත්විය යුතුයි.**
- **පළාත් සභා සහිත ඒකීය රාජ්‍යය තහවුරු කළ යුතුය.**

**ලංකා සමසමාජ පක්ෂය**

**ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය**

**ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණ**

**ශ්‍රී ලංකා මහජන පක්ෂය**

**දේශවිමුක්ති ජනතා පක්ෂය**

යන පක්ෂවලින් සැදී

# සමාජවාදී ජනතා පෙරමුණ

අංක 91, ආචාර්ය ඇන්.ඇම්. පෙරේරා මාවත
කොළඹ 08.
2013.06.27